

# කොඩියගෙ ළම

## ලක්ෂමන් කොඩිතුවක්කු

# අනාගත් පාල

**දිනය : 2022 ජූලි මස 07 වන දින**
**වෙලාව  සවස 3.30ට**

වසර පහක් අප රට පාලනය කළ පාල උන් නැහැ සොයාගෙන මම පොළොන්නරුවට ගියෙමි. ආරක්ෂක නිලධාරිගෙන් අවසර ගෙන මම 'වෙනස' මන්දිරයට ඇතුල් වුණෙමි. ගෘහමූලික කමත් අහිමිව ගල් කැටයමක් සේ හාන්සි පුටුවක සැතපී ඇඟිලි ගනිමින් සිටින එතුමා දුටු මට දුක වාවාගත නොහැකි විය. ඉතා සරලව මේස් බැනියමකින් හා සරමකින් සැරසී ඔහු කැටයම් එබ්බූ තේක්ක ලීයෙන් නිමකර ඇති හාන්සි පුටුවේ වාඩි වී සිටින්නේ කුඩා දරුවෙකු සමඟ ය. දරුවා ඔහුගේ සරොම් බෑයේ වැටී පැද්දෙන්නේ ඔහුටත් නොදැනෙන්නය.

''සර් සුබ සැන්දෑවක් සර්. කොහොමද සැපදුක්'' මම ඇසුවෙමි.

''තමුසෙ කවුද මට නිච්චියක් නැහැ''

''ඇයි සර් අද හවසට එන්න කියල සර්මනෙ කිව්වෙ. අර පත්තරේ ඉන්ටවීව් එකට''

''ආ දැන් මතකයි. අර අලුතින් ආපු වෙනස පත්තරේටනෙ. තමුසෙ රැවුල වවාගෙන ඉන්නකොට බයත් හිතුණා. කවුද දන්නෙ සහරාන්ලගෙ සනුහරේ එකෙක් ද කියලා. කෝ පෙන්නනවා අයිඩී කාඩ් එක.''

මම යටහත් නොවී පහත්ව හැඳුනුම්පත පෙන්වූයෙමි.

''හරි මෙතනින් වාඩිවෙලා අපි දැන් කතා කරමු''. ඔහු තවත් කැටයම්වලින් ඔපවත් වූ ආසනයක් මට පෙන්වූයේ ය.

''සර්ට හොඳ තේක්ක ලිවලින් හදපු ලී බඩු ටිකක් ලැබිල තියෙන්නේ''

''ඔව් අයිසෙ පරිසරයට ටිකක් හානිදායක වුණු ගස් ටිකක් කපපු එකෙක් මට පූජා කළා''
''කවුද සර් මේ බේබි'' මට දරුවා දිහා බලමින් එසේ ඇසුවෙමි.

''මේ අපේ දහම් පුතාගෙ කොල්ලනේ. මූ මෙහෙම හිටියට හරිම දඟයි. මූව දැක්කම මට ජනාධිපති තාත්තා පොතමයි මතක් වෙන්නෙ''
''අනෙක සර් දැන් සර් ඇඟිලි ගණන් කරනවා වැඩියි. නියපොතු හප හපා ඇඟිලි ගනිනවා ඇයි සර් ඒ''
''මං හැමදාම එකේ ඉඳන් දහනවයට ගණිනවා. දහනවයට ආපු හැටිය මට එක එකාගෙ අම්ම අප්ප මතක් වෙනවා. ඊට පස්සෙ ආපහු එකට යනවා. දහනවයෙන් නවත්තනවා''

''සර්ගෙ කාලෙ අපේ රටේ වෙනසක් වුණා කියල සර් සතුටු වෙනව ද?''

''ඇත්තටම අයිසෙ, මං වගේ මිනිහෙක් ජනාධිපති වෙච්ච එකම් වෙනසක් නෙවෙයිද?. හැබැයි ජනාධිපති වෙච්ච මං වෙනස්ම මිනිහෙක් කියල මං දැනගත්තෙ පත්තරෙන්. ඒක කියවල අහවර වෙනකොට හිතට දැනුනෙ මාර වෙනසක් අයිසෙ. ඒ සතුට දිගටම තිබ්බනං මට අපේ රටට මීටත් වඩා වෙනසක් කරන්න තිබුණා.''

''සර්ට හිතුන්නැද්ද අරය එක්ක එකතු වෙනකොට වෙනස්ම රටක් බිහිවෙන බව?... එකට එකතු වෙලා සිල්ලර කඩයක්වත් කරන්න බැරි අපේ ජාතියට රටකට වෙනසක් කරන්න. ඒකයි මං මෙහෙම ප්‍රශ්ණයක් ඇහුවෙ''

''ඒකට මං නෙවෙයිනෙ අයිසෙ වගකියන්න ඕනෙ. අර දිනපු දවස්වල උඩදාපු සුදු පරෙවියා. ඌ උඩගියේ නැහැනෙ. බිම දිගේනෙ ගියේ. ඒකට මං පළි ද? අනෙක ඒ පරෙයියා අරන් ආවෙ අරය. මගේ අතට දීල උඩ ඇරපන් කිව්වා''

''සර් ආවෙ හොරු අල්ලල හිරේ දාන්න නේ ද?''

''හිරේ නොදැම්මත් හොරා කවුද කියල මං පෙන්නුවනේ අයිසෙ. ඔක්කොම එවුන් ටික හොරු උනාම මං කාව අල්ලන් ද? අන්තිමේ හොරු ටික එකතුවෙලා මාව ඇල්ලුවා''

''එතකොට සර් රටේ කුඩු ප්‍රශ්නේ. ඒක තාම එහෙමමයිනෙ''

''කුඩු අල්ලල රට දියුණු කරනකොටනෙ අයිසේ බෝම්බ පිපුරුවේ. ඒ බෝම්බවලින් රට කුඩුවෙන්න දීලා මං බලාගෙන හිටියේ නැහැනේ. අනෙක බෝම්බ අපේ රටට අරුමයක් නෙවෙයිනෙ අයිසෙ. හැම කාලෙම පිපුරුවනේ. මං එක මිනිහෙක් මැරුවද? බෝම්බවලින් මැරෙන්න ඉඩ හැරිය මිසක්''

''සර්ගෙ පාලන කාලෙ රටට වෙච්ච නස්පැත්තිය ගැන මොකද හිතෙන්නේ''

''මමද ඕයි රට පාලනය කළේ. අරයනෙ. ගිහිල්ල මිනිහගෙන් අහනවා මොකද වුණේ කියල''

''ඒ වුණාට සර්ගෙ විධායක ජනාධිපති වෙලා හිටියෙ''

''කොහෙද ඕයි විධායක... අරයනෙ විධායක අගමැති. ඔය දහනවය ගෙනාවෙ නැත්තං මට පෙන්නන්න තිබුණා දියුණුව. අරයව තමයි ඔක්කොම කෑවෙ''

''දැන් සර්ට බැහැ දැකල කතා බහ කරල යන්න කවුරුත් එන්නැද්ද සර්''

''කවුරු එන්නද අයිසෙ. මං ගියා කීප දවසක් අරුන්ව හම්බ වෙන්න... අපේ දහම් කොලුවත් අඩුගානේ පොළොන්නරුව ඉල්ලගන්න බලන්ඩ එපායැ. දයාසිරියගෙ, හිස්බුල්ලගේ ගණන්. උන් දැන් මට කියනවා සළකල බලන්නං කියල''

ඔහුගෙන් සමුගත්තට පෙර මන්දිරයේ ඉදිරිපස බාල්කයේ එල්ලා ඇති කඹය මගේ ඇස ගැටිණි.

''මොකක්ද සර් මේ කඹේ. හරි ල්සසන කඹයක්''

''ආ ඔය අර එල්ලුම් ගහට ගෙනාපු කඹයනේ. තාම අපේ ගෙදර''

ඒ සමගම දුවගෙන ආ මුණුපුරා, ඔහුගේ සරම කඩා දමා දුවගෙන ගොස් කඹයේ එල්ලී ඔන්චිලි පදින්නට විය.

''මං කිව්වේ මූ පුදුම වසවර්තියෙක් කියල. මං ඒ කාලෙ වගේමයි. දැක්ක නේද මූ මාව සෙල්ලමට අරන් තියෙන හැටි. තමුන්ගෙ සීයා රටේ ජනාධිපතිවෙලා හිටිය කියලා ගාණක්වත් නැහැ. ඔහොම හිටු දුවන්නැතුව. ඔහු මුණුපුරා පසුපිට පන්නන විට මම ඔහුගෙන සමු නොගෙනම ''වෙනසෙන්'' මිදුලට බැස්සෙමි.






## විනී හෙට්ටිගොඩ





